**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව - 2015**

-------------------------------------------------------------------------------

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂයපථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.	මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**2.1	මතය**
**------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2	මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**
**-------------------------------------------**

**2.3	ලැබිය යුතු ගිණුම්**
**--------------------**

2012 වර්ෂයේ සිට හිටපු සභාපතිවරයාගෙන් සභාවට අයවිය යුතු මුදල් සහ ආපසු භාර නොදුන් ඉන්වෙන්ට්‍රි භාණ්ඩවල වටිනාකම වූ රු.71,162 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. මෙයින් රු.31,050 ක්වූ මුදල් අයකර ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයේ නඩුවක් පවරා තිබුණි.

**2.4	නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**
**--------------------------------------------------------------------------------**

නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 110 වගන්තිය | හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම මාස 06 කට වරක්ම වාහනවල ඉන්ධන දැවීම පිළිබඳව පරීක්ෂාකළ යුතු වුවත්, සියළුම වාහන සම්බන්ධයෙන් පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |

**3.	මූල්‍ය සමාලෝචනය**
**-----------------------**

**3.1	මූල්‍ය ප්‍රතිඵල**
**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,314,129 ක ඌණතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,187,102 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,501,231 ක පිරිහීමක් ඇති වී තිබුණි. ප්‍රදාන හා අනෙකුත් මාරු ගෙවීම් රු.8,333,678 කින් අඩු වුවද සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා වියදම් සඳහා භාණ්ඩාගාර ලැබීම් රු.7,973,872 ක් අඩුවීම, වැටුප් හා වේතන රු. 2,706,865 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 හා 2014 වර්ෂවල මූල්‍ය අතිරික්තයක් ද අනෙකුත් වර්ෂවල මූල්‍ය ඌනතාවයක් ද පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී ආයතනයේ දායකත්වය 2011

වර්ෂයේ සිට 2015 වර්ෂය වනවිට රු. 3,446,541 ක සිට රු. 19,501,966 දක්වා අඛණ්ඩ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනතෙහි 14(1) ඡේදය පරිදි රැකීරක්ෂා, පුහුණුව සහ අධ්‍යාපනය, විද්‍යාව සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම, ජීවන තත්ත්වය නංවාලීම, අවාසිකර තැනැත්තන්ගේ කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම ඇතුළු ජාතික මානව සම්පත් ප්‍රතිපත්තියේ සියලු අංශ පිළිබඳ සොයා බලා එම ප්‍රතිපත්ති කලින් කළ සමාලෝචනය කිරීම, එම වැඩසටහන් ක්‍රියාත්මක වීම සොයා බැලීම මූලික අරමුණු වේ.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික මානව සම්පත් ප්‍රතිපත්ති සඳහා විද්‍යාව සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම හා අවාසිකර කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම සහ ආණ්ඩුව විසින් අනුමත කරන ලද මානව සම්පත් සංවර්ධන සැලසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සොයා බැලීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී වැඩ සටහන් සකස්කර නොතිබුණි.
කෙසේ වුවද ජාතික මානව සම්පත් ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමේ කාර්යය කම්කරු අමාත්‍යාංශය හා එකතුව සිදුකිරීමට ආර්ථික කටයුතු පිළිබඳ කැබිනට් අනුකාරක සභාව මඟින් පවරා තිබූ අතර ඒ අනුව නිරීක්ෂණ මට්ටමින් එම අමාත්‍යාංශය සමඟ සම්බන්ධව කාර්යයෙහි නිරත වන බව සභාපතිවරයාගේ පිළිතුරු මඟින් මා වෙත දන්වා තිබුණි.

(ආ) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධනය පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වර්ෂය තුළදී ව්‍යාපෘති 3 ක් අවසන් කර අමාත්‍යවරයා වෙත වාර්තා ඉදිරිපත් කළ බව වාර්තා කර තිබුණද ඉදිරිපත් කළ ලිපි හා දින පිළිබඳ සාක්ෂි ඉදිරිපත් නොවුණි. පිළිතුර අනුව සභාපතිවරයා අග්‍රාමාත්‍යවරයාගේ උපදේශකවරයකු ලෙස කටයුතු කරන නිසා අදාල වාර්තා පෞද්ගලිකවම අදාල අමාත්‍යවරයා වූ අගමැතිවරයා වෙත භාරදී තිබුණි.

(ii) වර්ෂය තුළ සම්පූර්ණ කිරීමට යෝජිත වූ පර්යේෂණ ව්‍යාපෘති 06 ක භෞතික කාර්යසාධනය සියයට 60 සිට සියයට 90 දක්වා විය.

(iii) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනවලින් වැය කර තිබුනේ සියයට 37 ක් හෙවත් රු. 2,521,137 ක් පමණි. වර්ෂය තුළ සම්පූර්ණ කළ රැකියා දශ ලක්ෂයේ වැඩ සටහන සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශයක් සකස් කිරීම සඳහා වූ ව්‍යාපෘතිය සඳහා කිසිදු වියදමක් දරා නොතිබූ අතර සම්පත්දායකයින් ස්වේච්ඡාවෙන් දායකවූවන් වන නිසා පිරිවැය අවම වන බව සභාපතිවරයා විසින් පිළිතුරු මඟින් දන්වා තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව පනතේ 3 වන වගන්තිය අනුව සභාවේ සාමාජිකයන් මුදල්, අධ්‍යාපන, කම්කරු, තරුණසේවා, විද්‍යාව හා තාක්ෂණ, කෘෂිකර්ම හා සෞඛ්‍ය ආදී ප්‍රධාන අමාත්‍යාංශ 11 ක ලේකම්වරු හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ සභාපති ඇතුළු වෘත්තීය අධ්‍යාපන ආයතන 4 ක සභාපතිවරු සහ අමාත්‍යවරයා විසින් පත්කරන ක්ෂේත්‍රයේ ඉහළ පලපුරුද්ද ඇති නිලධාරීන් පස්දෙනෙක් ඇතුළත් සාමාජිකයන් 20 දෙනෙකුගෙන් සමන්විතවේ.

වර්ෂයක් සඳහා රැස්වීම් 12 ක් පැවැත්විය යුතු වුවත් 2015 වර්ෂය සඳහා රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබූ අතර එම රැස්වීම් වලදී ද ආයතනයේ අරමුණු ඉටුකිරීම සහ කාර්යසාධනය හා සම්බන්ධ යෝජනා ඉදිරිපත් කර නොතිබූ බවත් එබඳු තීරණ කිසිවක් ගෙන නොතිබූ බවත් නිරීක්ෂණය විය.

(ආ) වර්ෂය තුළ අවසන් කර අමාත්‍යවරයා වෙත භාරදී තිබූ රැකියා දශලක්ෂයක් නිර්මාණය කිරීම සඳහා වූ ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීම, අ:පො:ස(උසස් පෙළ) විෂයයන් තුනක් සමත් සියලු සිසුන් සඳහා උපාධියක් හෝ ඩිප්ලෝමා සහතිකයක් ලබාදීම සඳහා වූ යෝජනාවලියක් සැකසීම හා දළ ජාතික නිෂ්පාදිතයෙන් අධ්‍යාපනය සඳහා වන වියදම සියයට 1.5 සිට සියයට 6 දක්වා වැඩි කිරීම සඳහා වූ රජයේ යෝජනාව සාකච්ඡා කිරීම යන පර්යේෂණ වාර්තා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද පාලක සභා රැස්වීම් 02 හි පත්කර තිබූ සාමාජිකයන් 19 දෙනෙකු අතරින් එක් වරක් හෝ සහභාගී නොවූ සාමාජිකයින් සංඛ්‍යාව 05 ක් ද එක් රැස්වීම් වාරයකට පමණක් සහභාගී වූ සාමාජික සංඛ්‍යාව 07 ක් ද බව නිරීක්ෂණය විය.
සාමාජිකයන් කාර්ය බහුල වීම නිසා රැස්වීම් සඳහා සහභාගී වීම අපහසු බව ද මේ සඳහා පිළියමක් ලෙස පනත සංශෝධනය කිරීම සඳහා කටයුතු සම්පාදනය කරමින් පැවැතුනද සභාවේ ආයතනික ව්‍යුහය වෙනස් කරමින් පවතින නිසා එය තාවකාලිකව අත්හිටුවා ඇති බවද සභාපතිවරයාගේ පිළිතුරු මඟින් දන්වා තිබුණි.

(ඈ) පර්යේෂණ සමාලෝචනය හා මඟපෙන්වීම සඳහා කමිටුවක් (Steering committee) පත්කර නොතිබුණි.

**4.3 ආර්ථික නොවන ගණුදෙනු**

2015 වර්ෂයේ රැකියා අරුණ වැඩසටහන් 02 ක් සඳහා ඇස්තමේන්තු කළ පුද්ගලයන් 3000 න් 1759 ක් නොපැමිනීම නිසා මෙම වැඩසටහන යටතේ ආහාරපාන සඳහා රු. 208,674 ක් අනාර්ථික ලෙස වැය කර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

2011 දෙසැම්බර් 23 දිනැති අංක ඩීඑම්ජ්/06 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය පරිදි ආයතනයේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව සහ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාවේ යොදවන බවට තහවුරුකර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ගත ආදායම් සහ වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 20 සිට සියයට 3555 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6 පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) අරමුණු ඉටුකිරීම | පනතේ සඳහන් සියළු අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටුකර ගැනීම සඳහා වැඩ සටහන් සකස් කර අරමුදල් වෙන්කර ගැනීම කෙරෙහි අවධානය යොමු නොකිරීම හා ක්‍රියාකාරි සැලැස්ම පරිදි ඉලක්ක ඉටුකර ගැනීමට ක්‍රියා නොකිරීම. |
| (ආ) ලිපිද්‍රව්‍ය තොග පාලනය | ලිපිද්‍රව්‍ය තොගයට ගැනීමේදී, ද්‍රව්‍ය ලැබීම් නිවේදන හා නිකුත් කිරීමේදී ද්‍රව්‍ය නිකුත් කිරීමේ නියෝග භාවිතා කර විධිමත් අධීක්ෂණයක් යටතේ ලිපිද්‍රව්‍ය තොග පාලනයට ක්‍රියා නොකිරීම. |